රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

| ඒකාබද්ධ සේවා අංශය | **இணைந்த சேவைகள் பிரிவு** | **COMBINED SERVICES DIVISION** |
|---|---|---|
| නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka |

| දුරකතන | ෆැක්ස් | ඊ-මේල් | වෙබ් අඩවිය |
|---|---|---|---|
| தொலைபேசி:**(94) 011- 2694560** | தொலைநகல்:**(94) 011- 2692254** | மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** | இணையத்தளம்: **www.pubad.gov.lk** |
| Telephone | Fax | E-mail | Web Site |


| මගේ අංකය<br>எனது இல<br>My No | COM/Trans/වා.ස්.මා./2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2020.07.15 |
|---|---|---|---|---|---|

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන්

**<u>ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරු</u>**

ඒකාබද්ධ සේවයට අයත් නිලධරයන් අතරින් තම ස්ථාන මාරු අවශ්‍යතාවයන් විවිධ වෙබ් අඩවිවල පළ කරන නිලධරයන් වෙත, මෙම අමාත්‍යාංශයේ සේවය කරනු ලබන බවට තමන් විසින් හඳුන්වා දෙන පුද්ගලයින් දුරකතන ඇමතුම් ලබා දී ස්ථාන මාරු ඉල්ලීම් ඉටු කර දෙන බව දන්වා මුදල් බැංකු ගත කරන ලෙස බලපෑම් කරන බවට තොරතුරු වාර්තා වී ඇත.

02. එබැවින් ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් කිසිදු වෙබ් අඩවියක හෝ සමාජ ජාල මාධ්‍යය ඔස්සේ පළ නොකරන ලෙස දන්වා සිටින අතර එම මාර්ග ඔස්සේ පළ කරනු ලබන ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අංශයේ කිසිදු වගකීමක් නොමැති බව අවධාරණය කරමි. සියළු ස්ථාන මාරු ඉල්ලීම් ආයතන ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව මා වෙත යොමු කළ යුතු අතර ඒකාබද්ධ සේවයේ සාමාන්‍ය ස්ථාන මාරු ලබාදීම සඳහා හෝ සුහද ස්ථාන මාරු ගලපා දීම සඳහා මුදල් අය කරනු ලබන වංචනික පුද්ගලයින්ට මුදල් ලබා දීමෙන් වළකින ලෙසට සියළුම නිලධරයන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

03. තවද මේ සම්බන්ධයෙන් www.pubad.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති මගේ අංක COM/Trans/GEN/Vol-II හා 2017.11.14 දිනැති ලිපිය කෙරෙහිද අවධානය යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය